# WACE (වෙස්ටර්න් ඕස්ට්‍රේලියානු අධ්‍යාපන සහතික) භාෂා අයදුම්පත් කාර්යාවලිය - දෙමාපියන්/භාරකරුවන් හට තොරතුරු

*WACE භාෂා පාඨමාලාවකට*ඇතුලත්වීමට බලාපොරොත්තු වන සියළුම සිසුන් විසින් *WACE භාෂා පාඨමාලාවක්* සඳහා ඇතුලත්වීමට අවසර ඉල්ලා පාසැල් විෂයමාලා සහ ප්‍රමිති අධිකාරිය (අධිකාරිය) වෙත *සිසු පෝර්ටලය* https://studentportal.scsa.wa.edu.au ඔස්සේ භාෂා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කල යුතුය .

සිසුන් විසින් *භාෂා අයදුම්පත්‍රය* සම්පූර්ණ කල යුත්තේ ඔවුන් වසර 10* සිටින අතරතුරය.

*භාෂා අයදුම්පත්‍රය* සම්පූර්ණ කිරීම සඳහා සිසුවා විසින් නිවසේදී හෝ පාසැලේදී පරිගණකයක් භාවිතා කල යුතුය. ඔබට කිසියම් ප්‍රශ්නයක් ඇතිනම්, ඔබගේ භාෂා ගුරුවරයා හෝ පාසැල් පරිපාලනයෙන් උපකාර ඉල්ලා සිටින්න.

## අවශ්‍ය තොරතුරු

සිසුවා විසින් පහත තොරතුරු ලබා දිය යුතුය:

- පූර්ව-ප්‍රාථමික වසරේ සිට සෑම පාසැල් වසරක් සඳහාම සිටි පාසැල
- ඕස්ට්‍රේලියාවෙන් පිටත පාසැල්වලට ගිය අවස්ථාවල පාසැල් ප්‍රගති වාර්තා
- ඔවුන් කලින් ජීවත්වූ රටවල්
- යාමට හේතු සහ එක් එක් රටෙහි සිටි කාලය ඇතුළුව ඔවුන් කලින් ගිය/සංචාරය කල/නිවාඩු ගතකල රටවල විස්තර ඔවුන් ඉගෙනීමට අයදුම් කරන භාෂාව කථාකරන රටවල් පමණක් ඇතුළු කරන්න
- ඔවුන් කථා කිරීමට ඉගෙන ගත් පළමු භාෂාව/භාෂා
- ඔවුන් කථා කරන, කියවන සහ ලියන වෙනත් භාෂාව/භාෂා
- ඔවුන් සිය මාපියන් හෝ භාරකරුවන් සහ සිය සහෝදර සහෝදරියන් සහ මිතුරන් සමඟ කථා කරන භාෂාව/භාෂා
- ඔවුන්ගේ මාපියන් හෝ භාරකරුවන් කථා කරන භාෂාව/භාෂා

## උපකාරක ලියකියවිලි

සිසුන් විසින් සිය අයදුම්පත්‍රයට පහත ලියකියවිලිවල ඡායාරූප හෝ ස්කෑන් පිටපත් උඩුගත කල යුතුය:

- සම්පූර්ණ කල *මාපිය/භාරකාර පිළිගැනීමේ පෝරමය* (අනිවාර්යවේ)
- ඔවුන් ඉපදුනේ වෙනත් රටක නම් හෝ ඕස්ට්‍රේලියාවෙන් පිටත ජීවත්වූයේ නම්, ගමන් බලපත්‍රයේ හඳුනාගැනීමේ පිටුව
- ඔවුන් ඕස්ට්‍රේලියාවෙන් පිටත පාසැලකට/පාසැල්වලට ගියේ නම්, විදේශ පාසැල් ප්‍රගති වාර්තා/ව

- ඔවුන් අයදුම් කරන භාෂාව කථා කරන රටක ජීවත්වූයේ නම් හෝ නිතර ගමන් කලේ නම්, ජාත්‍යන්තර ගමන් වාර්තා/ව

භාෂා අයදුම්පත්‍ර ක්‍රියාවලිය සම්බන්ධ වැඩිදුර විස්තර [භාෂා අයදුම්පත්‍ර වෙබ්අඩවිය (https://www.scsa.wa.edu.au/sirs-and-srms-info/srms-information/wace-language-applications](https://www.scsa.wa.edu.au/sirs-and-srms-info/srms-information/wace-language-applications)) වෙතින් ලබාගත හැක.

* මෙය වසර 9 ගිෆ්ටඩ් ඇන්ඩ් ටැලන්ටඩ්/ඇක්සලරේ්ටඩ් භාෂා සිසුන් සිසුන් විසින් ඔවුන් 10 වසර සිටියදී වසර 11 භාෂා පාඨමාලාවක් අයදුම් කරන විටද අදාලවේ.